**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2017**

**----------------------------------------**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 148,939,054 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දින ආරම්භ කළ රු.1,494,871ක ස්ථාවර තැන්පතුවක් වෙනුවෙන් 2016 හා 2017 වර්ෂවල එම තැන්පත් ගිණුමට සෘජුව බැර වී තිබුණු පොළිය පිළිවෙලින් රු.99,708 ක් හා රු.161,371 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සේවයෙන් ඉවත්වූ නිලධාරීන් 06 දෙනෙක් සඳහා ගෙවූ පාරිතෝෂික දීමනා රු.4,102,736 ක් වුවද නිලධාරීන් 04 ක් සඳහා ගෙවූ රු.3,825,064 ක් පමණක් පාරිතෝෂික වෙන්කිරීම් ගිණුම හර කර ඉතිරිය රු. 277,672 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම් හා වියදම් රු.277,672 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨ පරිශ්‍රයේ ස්ථාපිත සන්නිවේදන කුළුණු දෙක සඳහා 2017 මාර්තු 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා වැයවූ විදුලි ඒකක වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙතින් අයකර ගත යුතු රු.782,574 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට විශ්වවිද්‍යාලයේ විදුලි වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත් වී ගිය, සේවය අතහැර ගිය හා ස්ථානමාරු ලබා ගිය නිළධාරීන් 11 දෙනෙකුගෙන් එකතුව රු. 1,141,570 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට 2018 ජූනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත් කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් 2011,2015,2016 හා 2017 වර්ෂවලදී නිලධාරීන් 09 දෙනෙකු වෙත ලබාදුන් රු.1,685,044 ක් වූ අග්‍රිම 11 ක් 2018 ජූලි 30 දින වන විටත් පියවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3. 1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.38,211,346 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,536,658 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.42,748,004 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම් රු.55,469,442 කින් වැඩිවී තිබුණද සේවක පාරිශ්‍රමික රු.58,235,425 ක් වැඩි වීම හා වෙනත් වියදම් රු.37,933,466 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013, 2014 හා 2017 වර්ෂවල ඌනතාවයක් වාර්තා වී තිබුණද 2015, 2016 වර්ෂවල අතිරික්තයක් ඇති වී තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ගැලපීම් කිරීමෙන් පසු 2013 වර්ෂයේ රු.290,282,935 ක් වූ දායකත්වය 2017 වර්ෂය වනවිට රු.514,967,837 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම සඳහා ක්‍රියාත්මක කාල රාමුව සඳහන් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම**

විභාග පවත්වා මාස 03 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත්කළ යුතු වුවත් නියැදි පරීක්ෂාවකදී එක් පීඨයක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා විභාග පවත්වා දින 122 සිට දින 261 දක්වා කාලයක් ගත කර තිබුණි. විශ්වවිද්‍යාලයේ ප්‍රායෝගික විභාග සඳහා ප්‍රතිඵල ලබාදීමට දීර්ඝ කාලයක් ගතකර තිබීම හා විශ්වවිද්‍යාලය තුල ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයට වඩා බාහිර අධ්‍යයන

කාර්යමණ්ඩලය වැඩි සංඛ්‍යාවක් සිටීම නිසා ඔවුන් වෙත ඇගයීමට යොමු කරන උත්තර පත්‍ර ප්‍රමාදවී ආපසු භාරදීම හේතුවෙන් ලිඛිත හා ප්‍රායෝගික විභාගවල සමස්ත ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) **ඒක ශිෂ්‍ය පිරිවැය**

2017 වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම් අනුව ඒක ශිෂ්‍ය පිරිවැය රු.425,602 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.300,660 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය සියයට 41 කින් වැඩි වී තිබුණු අතර ඒ සඳහා පුනරාවර්තන වියදම් රු.මිලියන 66 කින් වැඩිවී තිබීම හේතු වී තිබුණි.

(ඇ) **පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම**

විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයේ උපාධි පාඨමාලා 6 ක් සඳහා 2008 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 424 ක් වූ අතර එයින් පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව 78 ක් පමණක් විය. ශිෂ්‍යයින් 192 දෙනෙක් පාඨමාලා හැරගොස් තිබුණු අතර 154 දෙනෙකුගේ නිබන්ධන පරීක්ෂා කිරීමේ කටයුතු නිම වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 01 සිට වර්ෂ 09 දක්වා කාලයක සිට පැවතෙන ගිවිසුම් හා බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.6,694,442 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.1,022,650,000 ක්වූ ඉඩම් 3 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

2017 වර්ෂය ආරම්භයේ ඉතිරි වී පැවති රු. 8,024,948 ක් වූ භාණ්ඩාගාර පර්යේෂණ ප්‍රදානවලින් සමාලෝචිත වර්ෂයේ උපයෝජනය රු.2,310,734 ක් වූ අතර වර්ෂය අවසානයට රු.5,714,214 ක ශේෂයක් පැවතුණි. පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර පර්යේෂණ පරිසංවාද, පර්යේෂණ හා ප්‍රකාශන ජාත්‍යන්තර හා දේශීය සමුළු සඳහා ඉදිරිපත් කිරීම යනාදිය සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ අවධානය යොමු කිරීම අඩු බැවින් ඒ සඳහා වාර්ෂිකව භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය 2015,2016 හා 2017 වර්ෂවල පිළිවෙලින් සියයට 30ක්, සියයට 15 ක් හා සියයට 29 ක් තරම් පහළ මට්ටමක පැවතුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

බැංකු ජංගම ගිණුම් 02 ක 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.6,243,954 ක හා රු.26,638,718 ක ශේෂයක් පැවතුන අතර මෙම ගිණුම් දෙකෙහි වර්ෂය පුරාම පිළිවෙලින් රු.6,363,084 ක හා රු.26,318,724 ක මාසික සාමාන්‍ය ශේෂයක් පැවතීමෙන් ජංගම ගිණුම්වල විශාල ලෙස මුදල් ශේෂ පවතින බව නිරීක්ෂණය විය.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

2017පෙබරවාරි 01 දින විශ්වවිද්‍යාලය සඳහා නව කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට පැවති අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 60 කින් 2018 ජූලි 30 දිනට සම්පූර්ණ කර නොතිබුණු පුරප්පාඩු සංඛ්‍යාව 41 ක් විය.

## 5. තිරසාර සංවර්ධනය

------------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

----------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වේ. එහෙත් සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද එම ඉලක්ක කරා ලඟා විය යුතු සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

## 6.1 ප්‍රසම්පාදනය

-------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) අනුව රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද වටිනාකම රු.12,045,685 ක් වූ මිලදී ගැනීම් 03 ක් වෙනුවෙන් එසේ කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් වී නොතිබුණු පන්ති කාමර හා දේශනශාලා පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රූපවාහිනී යන්ත්‍ර ( LED Smart TV) 32 ක් සහ Blue Ray Player 32 ක් මිලදී ගෙන සපයා සවි කිරීම සඳහා රු.6,063,327 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම භාණ්ඩ පරීක්ෂාකර ඉන්වෙන්ට්‍රිගත කර ඇත්තේ භාණ්ඩ ලැබී මාස 03 කට පසුව වේ.

මෙම ප්‍රසම්පාදනය සඳහා වූ මිල කැඳවීම් අනුව භාණ්ඩ සැපයීම, බෙදාහැරීම හා සවිකිරීම සැපයුම්කරු විසින් ඉටුකළ යුතු අතර 2018 ජූලි 30 දිනටද එම සවිකිරීම් නිම කර නොතිබුණද කාර්යසාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කරගෙන නොතිබුණි. තවද සවිකිරීම සඳහා අවශ්‍ය රාක්ක නොමැතිවීම නිසා මිලදීගත් Blue Ray Players 32 නිෂ්කාර්යව ගබඩාවේ තිබුණි.

(ඇ) 2017 ජූනි 01 දින නර්තන හා නාට්‍ය කලා පීඨයේ පරිගණක විද්‍යාගාරය සඳහා ඇනවුම් කළ රු.689,900ක් වූ පරිගණක 05 ක් 2018 ජුනි 30 දින දක්වාම ලැබී නොතිබුණි.

එහෙත් ඒ සමඟ ඇණවුම් කළ යූපීඑස් බැටරි 05 ක් 2017 ජූනි 30 දින ලැබී තිබුණත් පරිගණක නොමැති හෙයින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර සියයට 22 සිට සියයට 100 ක් දක්වා විචලනයන් පැවති අවස්ථා 27ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම හා සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් සම්බන්ධයෙන් විස්තර හෙළිදරව් නොකිරීම. |
| (ආ) | මුදල් හා බැංකු | බැංකු ජංගම ගිණුම්වල විශාල ලෙස මුදල් ශේෂ රඳවාගෙන තිබීම. |
| (ඇ) | පර්යේෂණ ක්‍රියාත්මක කිරීම | පර්යේෂණ කිරීම සඳහා ලැබෙන මුදල් ඌන උපයෝජිතව පැවතීම හා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම මන්දගාමී වීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලවල නිලධාරීන්ගේ නිවාඩු නිසි පරිදි ලේඛන ගතකර නොතිබීම හා පැමිණීම, පිටවීම නිසි පරිදි සටහන් නොකිරීම, නිලධාරීන් දිවයිනෙන් පිටත ගත කරන නිවාඩු, විවේක නිවාඩුවලින් අඩු නොකර අනියම් නිවාඩුවලින් අඩුකර තිබීම, සම්පූර්ණ වැටුප් වර්ධක කාලය තුල සේවය කර නොතිබියදී වැටුප් වර්ධක ගෙවීම. |